A

## නිවේදනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරන ලද "ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

එකී පනත් කෙටුම්පතෙහි 2(2), 2(3), 2(4) සහ11(2) යන වගන්ති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9, 10, සහ 14(1) (ඉ) යන ව්‍යවස්ථා වලට අනනුකූල වන බවද, පනත් කෙටුම්පතෙහි 4, 5 සහ 13(1) යන වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 ව්‍යවස්ථාවට අනනුකූල වන බවද, පනත් කෙටුම්පතෙහි 12 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9, 10,12, 14(1) (ඉ) ව්‍යවස්ථාවලට අනනුකූල වන බවද, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාවෙහි සඳහන් පරිදි පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර ඡන්දයකින් අනුමත කිරීමෙන් සහ ජනමත විචාරණයකින් ජනතාව විසින් අනුමත කිරීමෙන් පමණක් සම්මත කළ හැකි බවත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කොට ඇත.

තවදුරටත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත්තේ, ඉහත සඳහන් වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කළහොත් ඒවායේ අනනුකූලතාවයන් ඉවත්වනු ඇති බවයි:–

(අ) 2(3), 2(4), 4 සහ 5 වැනි වගන්ති ඉවත් කිරීමෙන්; සහ

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ යෝජනා කර ඇති පරිදි 2(2) 11(2) සහ 13(1) වැනි වගන්ති සංශෝධනය කිරීමෙන්,

ඉහත සඳහන් කරන ලද සංශෝධනවලට යටත්ව පනත් කෙටුම්පතෙහි අනෙකුත් විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවේ.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි යෝජනා කරමි.